**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ වැන්දඹු හා අනත්දරු අරමුදලට ගෙවිය යුතු රු.1,154,008 ක් එම ගිණුමට බැර කිරීම වෙනුවට හර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සභා රැස්වීම් ශාලාවේ ප්‍රවේශ මාර්ගය හා කාණු පද්ධතිය සකස් කිරීම සඳහා රු.4,000,000 ක් වටිනා ව්‍යාපෘතියකට ගිවිසුම්ගතව නොතිබියදී, එම මුදල ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසානයට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු.5,672,584 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි තොරතුරු ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු ආදායම රු.1,010,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සභාවේ බැංකු ජංගම ගිණුම් අතර මුදල් මාරු කිරීම්, ලෙජර් ගිණුමක් හරහා සිදුකර තිබූ අතර වර්ෂය අවසානයට එම ගිණුම තුලනය විය යුතු වුවද, තවදුරටත් රු.63,553 ක නිරවුල් නොකළ ශේෂයක් පැවතුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.240,309 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) **ලැබිය යුතු ගිණුම්** | | |
| ඉකුත් වර්ෂයටත් පෙර සිට පැවත එන රු.7,981,282 ක් වූ පළාත් සභා ආදායම් ආධාර සහ 2013 වර්ෂයේ සිට ඉදිරියට එන රු.81,800 ක ලැබිය යුතු ත්‍රීරෝද රථ ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකර ගනිමි. |

**(ii)** **ගෙවිය යුතු ගිණුම්**

| | | |
|---|---|---|
| වසර 05 කටත් අධික කාලයක සිට ඉදිරියට ගෙන එන එකතුව රු.240,517 ක් වූ මුද්දර ගාස්තු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගනිමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 සිට 572 දක්වා. | 966,075 | වසර 02 ඉක්ම වූ තැන්පතු 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ආ) | 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 3(x) ඡේදය | 31,250 | සභාවේ සේවය කරන ප්‍රජා සංවර්ධන නිලධාරීවරයාට චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2017 වර්ෂයේ සිට 2019 ජනවාරි මාසය දක්වා දුරකථන දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

# 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,061,070 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.6,397,787 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,398,040 | 733,698 | 750,154 | 257,050 | 1,233,040 | 652,186 | 672,184 | 279,270 |
| කුලී | 4,715,000 | 5,555,566 | 5,556,581 | 217,000 | 4,209,100 | 4,215,427 | 4,214,527 | 119,909 |
| බලපත්‍ර ගාස්තු | 1,659,000 | 2,631,307 | 1,622,307 | 1,003,250 | 1,609,000 | 989,113 | 990,613 | (4,750) |
| වෙනත් ආදායම් | 64,465,000 | 34,954,519 | 37,442,557 | 7,883,048 | 62,741,000 | 37,967,146 | 36,731,869 | 15,546,683 |
| | 72,237,040 | 43,875,090 | 45,371,599 | 9,360,348 | 69,792,140 | 43,823,872 | 42,609,193 | 15,941,112 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.59,816,202 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.45,371,600 ක් වීමෙන් වර්ෂය අවසානයට රු.9,360,348 ක හිඟයක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ රු.1,012,968 ක් අයවිය යුතුව තිබුණ ද, මුළු අයවීම් රු.750,154 වීම නිසා වර්ෂය අවසානයට | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට |

| | | |
|---|---|---|
| රු.257,050 ක හිඟ ශේෂයක් පැවතුණි. | වේ. | කටයුතු කරමි. |
| (ආ) ප්‍රාදේශීය සභා පනතේ 134(2) වගන්තිය අනුව බල ප්‍රදේශයේ සංවර්ධන මට්ටම සැලකිල්ලට ගෙන වරිපනම් බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබූ නමුත්, මෙම ප්‍රදේශවල සභා අරමුදලින් වියදම් දරමින් මසකට ටොන් 45 ක කසළ එකතු කිරීමද, නාගරික මාර්ගවල විදුලි පහසුකම් ලබා දීම ඇතුළුව නාගරික පහසුකම් ලබා දීමේ කටයුතු සිදු කර තිබුණි. | වරිපනම් ප්‍රදේශ නම් කර, වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුරුඳු වගා ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.450,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණද, එම ආදායම අයකර ගෙන නොතිබුණි. | ඇස්තමේන්තුගත ආදායම අයකර ගත යුතු වේ. | වර්ෂය තුළ රු.151,873 ක මුදලක් අයකර ඇති අතර, ඉතිරි මුදල් ඉදිරියේ දී අයකිරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කිරීම සඳහා සැලසුම්කළ කර්තව්‍යන් 47 කින් එක් කාර්යයක් | ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් | පිළිතුරු දී නොමැත. |

| | |
|---|---|
| සඳහා පමණක් වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන සලසා ගැනීම නිසා කර්තව්‍යයන් 46 ක් ඉටු කළ නොහැකි වී තිබුණි. | ඉටුකර ගත යුතු වේ. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති දෙකක් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන රු.80,000 ක් ලැබී තිබුණ ද, ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබූ අතර, ලද මුදල් කර්මාන්ත ගිණුමේ තැන්පත් කර තිබුණි. | ව්‍යාපෘති නිසි පරිදි ඉටුකළ යුතු වේ. | 2019 වර්ෂයේ ව්‍යාපෘති ඉදිකිරීමේ බලාපොරොත්තු වෙන් තැන්පත් ගිණුමේ තැන්පත් කර ඇත. |

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොම්පෝස්ට් ව්‍යාපෘතියට එරෙහිව බාහිර පාර්ශවයක් 2017 වර්ෂයේ නඩු පවරා තිබූ අතර නඩු වාර 10 ක් සඳහා රු.78,000 ක මුදලක් සභා අරමුදලින් දරා තිබුණි. නඩු පැවරීම නිසා 2018 වර්ෂය සඳහා පරිසර බලපත්‍රයක්ද ලබා දී නොතිබුණි. | විධිමත් ක්‍රමවේදයකට කසළ ප්‍රතිචක්‍රීක රණය කර පරිසර බලපත්‍ර යක් ලබා ගත යුතු වේ. | ඉදිරියේදී පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් විථි පහන් නඩත්තුව සඳහා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී නොතිබූ අතර, විථි පහන් නඩත්තුව සඳහා සභා අරමුදලින් රු.2,026,611 ක මුදලක් වැය කර තිබුණි. විදුලිබල මණ්ඩලය අනුමත කළ වීථි පහන් සඳහා අනුමත මුදල ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි. | ගිවිසුම් අත්සන් කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිවිසුම් අත්සන් කරමි. |
| (ආ) | ග්‍රාමීය ජනතාව සඳහා පුස්තකාල පහසුකම් ලබා දීමේ අරමුණින් පවත්වාගෙන ගිය ජංගම පුස්තකාල සේවයක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නතර වී තිබුණි. | පොත්පත් හා උපකරණ ඵලදායී කාර්යයකට යෙදවීම කළයුතු වේ. | ඵලදායී නොවන බැවින් එම සේවාව නතර කර ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ද්විතියීක අංශයේ නිලධාරීන් 04 ක්, ප්‍රාථමික අංශයේ නිලධාරීන් 04 ක් වශයෙන් පුරප්පාඩු 08 ක් පැවැති අතර එම පුරප්පාඩු සඳහා විධිමත්ව බඳවා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන අමාත්‍යාංශය හරහා පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | විධිමත් අනුමැතියකින් තොරව සභාව විසින් බඳවාගෙන තිබුණු අනියම් හා ආදේශක සේවකයින් 09 දෙනෙකුගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සභා අරමුදලින් රු.2,617,364 ක් සමාලෝචිත වර්ෂයේ වැයකර තිබූ අතර, එම පත්වීම් විධිමත් කර ගැනීමට සභාව කටයුතු කරගෙන නොතිබුණි. | ආදේශක සේවකයන් විධිමත් කර ගතයුතු වේ. | සභා යෝජනාවක් මත ගෙවීම් කර ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වාහන උපයෝජනය** | | |
| සභාව විසින් භාවිතා කරන ලද මිනි ට්‍රැක්ටරය ධාවනයෙන් ඉවත් කර තිබූ අතර ඒ සම්බන්ධව 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අබලන් වාහන භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අබලි වාහන ඉවත් කළ යුතු වේ. | ඉදිරියේ දී අපහරණය කිරීමට කටයුතු කරමි. |

**3.5 හඳුනා ගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට අධිභාර ලෙස රු.136,582 ක් ගෙවීමට සිදු වී තිබූ අතර ඉන් රු.129,821 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 156(1) රෙගුලාසිය ප්‍රකාරව සභා අරමුදලට සිදු වූ පාඩුව මෙම වාර්තාවේ දිනය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා අරමුදලට සිදු වූ පාඩුව අයකර ගත යුතු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව රු.160,318 ක වටිනාකම වූ පුස්තකාල පොත් 1,339 ක ඌනතාවයක් විය. | සිදු වූ පාඩුව අයකර ගත යුතු වේ. | සමථ මණ්ඩලයකට යොමු කර නීතිමය වශයෙන් කටයුතු කර, අලාභයන් අයකර ගනිමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | එක් ආදායම් විෂයයක රු.132,000 ක් වූ ඇස්තමේන්තුගත ආදායමින් කිසිදු මුදලක් උපයාගෙන නොතිබූ අතර, එක් වැය විෂයයක් සඳහා වෙන්කළ රු.1,054,000 ක මුදලින් කිසිදු වැය දැරීමක් සිදුකර නොතිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 06 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.36,579,514 ක් වූ අතර, එම අගයන් සියයට 37 සිට සියයට 62 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ඇ) | වියදම් විෂයයන් 08 ක එකතුව රු.36,433,805 ක් වූ ඉතිරිවීම් තිබූ අතර, එම අගයයන් සියයට 26 සිට සියයට 92 අතර පරාසයක පැවැතුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ඈ) | එක් වියදම් විෂයක අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.178,961 ක් හෙවත් සියයට 36 ක් වියදම් දරා තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | නිලධාරීන් සහභාගී නොවීම මත විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට නොහැකි විය. |